ශ්‍රී ලාල් ප්‍රියන්ත

ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මකකිරීමේ අමාත්‍ය සහ ජාතික ආරක්ෂාව පිළිබඳ රජයේ මාධ්‍ය ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල මහතා එක්සත් ජාතික පක්ෂයේ මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. ඔහු පසුගිය දා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මහින්ද චින්තන වැඩපිළිවෙළට සහාය පළ කරමින් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට එකතුවීය පසුගිය කාලපරිච්ඡේදය තුළ එක්සත් ජාතික පක්ෂය හරහා මහනුවර දිස්ත්‍රික්කයට තරග කළ සෑම මැතිවරණයකින්ම කෙහෙළිය රඹුක්වැල්ල මහතා දිස්ත්‍රික්කයේ වැඩිම මනාප ඡන්ද ලබාගෙන ප්‍රථම ස්ථානය ට පත්වුණේ සියලු දේශපාලන පක්ෂවල තරගකරුවන් විසඳමයට පත් කරවමිනි. මැතිවරණය හරහා සිදුවූ යම් යම් ප්‍රචණ්ඩකාරී සිද්ධීන්වලට සම්බන්ධ බවට චෝදනා එල්ලවීම නිසා පොදුජන එක්සත් පෙරමුණු පාලන කාලය තුළ ඔහුට අවස්ථා කිහිපයකදීම නීතිය ඉදිරියේ පෙනී සිටිමට පවා සිදුවිය.

එක්සත් ජාතික පක්ෂයේ බලගතු චරිතයක් වූ කෙහෙළිය රඹුක්වැල්ල මහතා ආණ්ඩු පක්ෂයට එකතු වුණේ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වය කෙරෙහි කැලකිරීමකට පත්ව ය. එදා එ.ජා.ප. යේ ප්‍රබල පුද්ගල චරිතයක් වූ කෙහෙළිය රඹුක්වැල්ල මහතා අද ආණ්ඩු පක්ෂයේ මුල් පෙළේ ප්‍රබල චරිතයක් වී ඇත්තේ ජනාධිපතිවරයාගේ පවා මහත් පැසසුමට ලක්වෙමිනි.

ඔහු ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැඩකටයුතු කෙසේ වෙතත්, ජාතික ආරක්ෂාව පිළිබඳ රජයේ මාධ්‍ය ප්‍රකාශක තනතුරු ඉමහත් දැකුම්කළු ආකාරයට මෙහෙයවමින් සිටින බවක් පෙනේ. ඒ කෙරෙහි එල්.ටී.ටී.ඊ. පාර්ශවය නම්, එතරම් රුචියක් දක්වන්නේ නැත. ඔවුන්ට කෙහෙළියගේ ප්‍රකාශ වහ කඳුරු මෙන්ය. කෙහෙළිය දෙස ප්‍රහාකරන් බලන්නේ නයාට අඳුකොළ සේ ය. එතරම්ම බරපතල වෛරයක් එල්.ටී.ටී.ඊ. පාර්ශවයෙන් ඔහු වෙත එල්ල වී ඇත.

මේ නිසා එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මරාගෙන මැරෙන කල්ලියේ ප්‍රධාන ඉලක්කයක් බවට කෙහෙළිය රඹුක්වැල්ල මහතා පත්ව ඇත. යම්කිසි අවස්ථාවක ඔහු ඊට ගොදුරු වීමට බැරි නැත. එබැවින් ඔහුගේ ආරක්ෂාව තර කරන ලෙස රාජ්‍ය බුද්ධි සේවය ිගෂගීග* යුද හමුදා රහස් තොරතුරු අංශය හා පොලිස් බුද්ධි අංශයේ සිය රහසය වාර්තා හරහා රජයේ වගකිවයුතු පාර්ශවවලාට ලිඛිතව දැනුම් දී ඇත.

තමන්ට එල්ල වී ඇති මරණ තර්ජන පිළිබඳව රඹුක්වැල්ල මහතා පසුගිය දිනක ජනාධිපතිවරයාට පවා දැනුම් දී තිබිණ. ඒ කෙරෙහි සිය අවධානය යොමු කළ ජනාධිපතිවරයා පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාට ප්‍රකාශ කර ඇත්තේ කෙහෙළිය රඹුක්වැල්ල මහතාගේ ආරක්ෂාව තර කරන ලෙස ය.

ඊට ප්‍රතිචාර දක්වා ඇති පොලිස්පතිවරයා විසින් රඹුක්වැල්ල මහතාගේ ආරක්ෂාවට පොලිස් නිලධාරීන් රැගත් තවත් පරිවාර ජීප් රථයක් ලබාදීමට තීරණය කෙරිණි. ඒ සඳහා ලබා දුන්නේ මිරිහාන විශේෂ මෙහෙයුම් ඒකකයට අයත් 65 - 6745 අංක දරණ ජීප් රථයයි. මෙම ජීප් රථය ලබා ගැනීම තුළින් පුරප්පාඩු වූ මිරිහාන විශේෂ මෙහෙයුම් ඒකකයේ මෙහෙයුම් කටයුතු උදෙසා H.P.L.B. 4312 අංකය දරණ කැබ් රථය ලබාදීමට පියවර ගැනිණි. එහෙත් ඒ සම්බන්ධයෙන් එහි පොලිස් නිලධාරීන් එතරම් කැමැත්තක් දක්වන්නේ නැත. ඉතාමත් පහසුවෙන් ගොස් මෙහෙයුම් කර අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට තිබූ ජීප් රථය බාගෙන "ලොරි භාගයක්" වැනි කැබ් රථයක් ලබාදීම පිළිබඳව ඔවුහු සිය අප්‍රසාදය පළකර සිටිති.

පොලිස් දෙපාර්තමේන්තුවේ වෙනත් අංශවල අවශ්‍ය තරම් වාහන තිබියදී, අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමට වෙන්කර තිබූ මිරිහාන මෙහෙයුම් ඒකකයේ ජීප් රථයම එයා ලබා දුන් නේ ඇයි ද, යන්න ඔවුන්ගේ ප්‍රශ්න කිරීමට භාජනය වී ඇත.

කෙහෙළිය රඹුක්වැල්ල ඇමැතිවරයාගේ මරණ තර්ජන කටාවේ තවත් එක් පරිච්ඡේදයක් පසුගිය ජූලි මස 13 වැනි දා කරලියට පැමිණියේ ය. එය ඉතාමත් සැලසුම් සහගත ජවනිකාවකි. ඇමැතිවරයාගේ සුවිසල් නිවස පිහිටා ඇත්තේ මහනුවර බහිරවකන්ද ප්‍රදේශයේ ය. එදින රාත්‍රී ඇමැතිවරයා සිය ආරක්ෂක භටයන් සමග කොළඹ සිට එම නිවස බලා ඒමට නියමිතව සිට ඇත.

ඇමැතිවරයාටා මැති ඇමැති ආරක්ෂක සේවයේ (MSD) ආරක්ෂක භටයන්ට අමතරව තවත් ආරක්ෂක භටයන් පිරිසක් සිටිති. ඔවුන් ක්‍රියාත්මක වන්නේ මහනුවර පොලිසිය කේන්ද්‍ර කරගෙන ය. එහි මූලිකත්වය දරන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයෙකි. විශේෂයෙන්ම ඇමැතිවරයාගේ මහනුවර බහිරවකන්ද නිවසේ ආරක්ෂක කටයුතු සොයා බලමින් අවශ්‍ය ආරක්ෂක විධිවිධාන යොදන්නේ එම ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ය.

කෙහෙළිය රඹුක්වැල්ල ඇමැතිවරයා මහනුවර නිවසට පැමිණීමට නියමිතව තිබූ බව කියන පසුගිය ජූලි මස 13 වැනි දා රාත්‍රී 9.30 ට පමණ එම ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා තවත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සමග එක්වී ඇමැතිවරයා ගමනාගමනයේ යෙදෙන බහිරවකන්ද මාර්ගයේ අසාමාන්‍ය සෝදිසි මෙහෙයුමක යෙදී ඇත. එවිට ඇමැතිවරයාගේ නිවසට මීටර් 200 ක් පමණ දුරින් ඉලුක් පඳුර සැරවට වැවී තිබුණ ලඳු කැළෑ බිමක සවිකර තිබූ සංචාරක පුවරුවක පසුපස අටවා තිබූ ක්ලේමෝ බෝම්බ දෙකක් සොයා ගැනීමට ඔවුනට හැකි වී ඇත. ඊට අමතරව ඩෙටනේටර් දෙකක්, අඩි 35 ක් පමණ දිග වයර් රෝල් එකක්, ක්ලේමෝ දෙක පිපිරීමට අඩි 30 ක් පමණ දුරට ඇද තිබූ වයර් එකක් හමු වී තිබේ.

ක්ලේමෝ බෝම්බ දෙකේ බර කිලෝ හතරක් පමණ වෙයි. එහි 'ඉදිරිපස සතුරාට' යනුවෙන් සටහන් කර තිබිණි. මෙම බෝම්බ දෙක 2000 වර්ෂයේදී මාන්තුළමි හමුදා කඳවුරට කොට් ප්‍රහාර එල්ල කළ අවස්ථාවේ පැහැර ගෙන ගිය ඒවා බවට මහනුවර පොලිසිය පවසයි. එය සත්‍යයක් නම්, වසර හයකට ආසන්න කාලයක් එම ක්ලේමෝ බෝම්බ තම ප්‍රහාරක ඉලක්කවලට යොදු නොගෙන සුරක්ෂිතව තබාගෙන සිටි යැයි ප්‍රකාශ කිරීම පිළිගැනීමට අපහසු අසාමාන්‍ය තත්ත්වයක්.

අප දන්නා පසුගිය කාලවකවානුව තුළ කොට් රජයේ ආරක්ෂක අංශවලින් පැහැර ගත් ක්ලේමෝ බෝම්බ රජයේ මැති ඇමැතිවරු හෝ ආරක්ෂක අංශ භටයන් ඝාතනය කිරීමට යොදාගෙන නැත. එවැනි සිද්ධියක් පසුගිය වසර හයකට ආසන්න කාලය තුළ ආසන්න ලඳුණු ප්‍රථම අවස්ථාව මෙය වනු ඇත.

ඊටත් කොටින්ගේ ප්‍රධාන ඉලක්කයන් වන ඇමැතිවරයාව ඝාතනය කිරීමට කොට් වසර හයක් පරණ ක්ලේමෝ බෝම්බ යොදා ගැනීමට තරම් මන්ද බුද්ධිකයෝ නොවෙති. පොලිසිය පවසන ආකාරයට මේ ක්ලේමෝ බෝම්බ දෙක 2000 දී මාන්තුළමි හමුදා කඳවුරෙන් කොට් පැහැර ගත් ඒවා ය. දැන් උදාවී ඇත්තේ 2006 වර්ෂයේ ජූලි මාසයයි. එවිට එම කාල වකවානුව වසර හයකි. නමුත් මෙම ක්ලේමෝ බෝම්බවල නිෂ්පාදන (සකස් කළ) වර්ෂය ඊටත් වඩා පරණ වන්නට ඇත.

එතරම්ම පරණ ක්ලේමෝ බෝම්බ අටවා රඹුක්වැල්ල ඇමැතිවරයාව ඝාතනය කිරීමට කොට් උත්සුකවීම යනු විශ්වාස කිරීමට අපහසු දෙයකි. සමහර විට එවැනි පරණ බෝම්බ අටවා ඝාතන ක්‍රියාවලියට කිරීමට ගොස් තාක්ෂණික කරුණු හේතු කොට ගෙන පිපිරි නොයන්නට ඇත. එබැවින් කොට් දුරදිග නොබලා මන්දබුද්ධික වැඩ කරන්නේ නැත. ඔවුන් බොහෝවිට දුර දක්නා නුවණින් යුතුව මෙවැනි වැදගත් ඇමැතිවරයෙකු ඝාතනය කිරීමට හොඳ තාක්ෂණික තත්ත්වයකින් යුතු අධිබලැති බෝම්බ යොදා ගනු ඇත.

එසේනම්, කෙහෙළිය රඹුක්වැල්ල ඇමැතිවරයාව ඝාතනය කිරීමට අටවා තිබූ ක්ලේමෝ බෝම්බ දෙකේ රහස කුමක් ද? මේ පිළිබඳව මහනුවර මූලස්ථාන පොලිසියට අමතරව රාජ්‍ය බුද්ධි සේවයේ විශේෂ පරීක්ෂණයක් ආරම්භ කෙරිණි. එහිදී රඹුක්වැල්ල ඝාතන බෝම්බ සිද්ධියේ බරපතල කරුණු රාශියක් හෙළි වී ඇත.

එම කරුණුවලට අනුව මෙම ක්ලේමෝ බෝම්බ ඇටවීමට එල්.ටී.ටී.ඊ. ය සම්බන්ධ වී නැත. මෙය පොලිස් නිලධාරීන් පිරිසක් ඉතාමත් සැලසුම් සහගතව කළ කුමන්ත්‍රණකාරී වැඩකි. මීට පෙර ඇමැතිවරයා මෙම මාර්ගයේ පැමිණෙන විට බොහෝදුරට පූර්ණ සෝදිසි මෙහෙයුම්වලට ලක්වන්නේ නැත. මෙදිනම රාත්‍රියේ හිටි අඩියේම පොලිස් නිලධාරීන් තිදෙනෙක් එම මාර්ගය පූර්ණ සෝදිසි කිරීමට පෙළඹුණේ ඇයි? ඒ ඔවුන් බෝම්බය ගැන කල්වේලා ඇතිව දැනගෙන සිටි නිසා ද? එසේ නැත්නම්, ඊට පරිබාහිරව ඇති සාධක මොනවා ද යන්න බුද්ධි සේවයේ පරීක්ෂණයට භාජනය වී ඇත.

ඊටත් මෙම ක්ලේමෝ බෝම්බ දෙක අටවා තිබුණේ කැළෑවලින් වට වූ සංචාරක පුවරුවක පිටුපස ය. එය මොනම හේතුවක් මතවත් මාර්ගයේ යන අයෙකුට පෙනෙන්නේ නැත. බෝම්බය පිපිරීමට සම්බන්ධ කර අඩි 30 ක් පමණ දුර ඇද තිබූ වයර් එක පවා කැළෑ නිසා පාවේ යන අයෙකුට රාත්‍රියේ පෙනෙන්නේ නැත. එතරම් බරපතළ ලෙස රහස්‍ය ස්ථානයක සඟවා තිබූ බෝම්බ දෙකක් සොයා ගැනීමට නම්, එය සොයාගත් පොලිස් නිලධාරීන්ට දිව්‍ය ඥානය තිබිය යුතු ය. නැත්නම්, එවැනි දෙයක් සොයාගත හැක්කේ එම ස්ථානයේ බෝම්බ ඇටවූ සහ ඒ ගැන නිශ්චිත තොරතුරු දන්නා අයෙකුට පමණි. වෙනත් අයෙකුට එය සොයා ගැනීම අපහසු ය. එබැවින් මෙම බෝම්බ සොයාගත් නිලධාරීන් මෙම කරුණුවලින් එකක් හෝ සියල්ලට සාපුව හෝ වතුව කිසියම් සම්පබවක් දක්වන බව රාජ්‍ය බුද්ධි සේවා පරීක්ෂණ කරුණු වලින් සැක කර සිටී.

කොට් සංවිධානය ක්ලේමෝ බෝම්බ පිපිරීමට දුරස්ථ පාලන උපකරණ යොදාගැනීම නිරතුරුව සිදුවන දෙයකි. නමුත් රඹුක්වැල්ල ඇමැතිවරයාව ඝාතනය කිරීමට ක්ලේමෝ බෝම්බ අටවා වයර් සවි කළාට, ඒවා සියල්ල පොලිසිය සොයා ගත්තාට, පිපිරීමට යොදා ගනු ලබන දුරස්ථ පාලන උපකරණ සොයා ගැනීමට සමත් වුණේ නැත. එයට සිදුවුණේ කුමක් ද යන්න ඊළඟට මතුවන ප්‍රශ්නයයි.

පරීක්ෂණ අංශ පවසන ආකාරයට මෙම බෝම්බ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ඒවා ය. ඒවා කිසියම් හිතවත් මාර්යයකින් ඇමැති සගයන් ලබාගෙන මෙම ස්ථානයේ අටවා ඇත්තේ ඇමැතිවරයාව ඝාතනය කිරීමේ අරමුණින් නොව, ඇමැතිවරයාට කොට් තර්ජන ඇති බවටත්, කොට් ඝාතන ප්‍රයත්නයකින් ඔහු වැළකුණු බවටත්, ජනමාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලබාගෙන අවට සමාජයේ අවධානය දිනාගැනීමේ අරමුණින් බව පරීක්ෂණ අංශවල කතාබහට ලක් වී ඇත.

බෝම්බ ඇටවූ බවට චෝදනා එල්ල කරමින් මහනුවර මහයියාවේ පදිංචි දෙමළ ජාතික තරුණයන් අට දෙනෙක් මහනුවර මූලස්ථාන පොලිසිය මගින් සැකපිට අත්අඩංගුවට ගනු ලැබූහ. ඉන් සිංහාරවේල් නිරෝෂාන්, තවිජන් කුලලේන්දුන් සහ එන්. කමලරාජ් යන තිදෙනාව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් ලක්ෂය බැගින් වූ ඇප මත නිදහස් කෙරිණි. අනෙක් දෙමළ තරුණයන් පස් දෙනාව රිමාන්ඩ් භාරයට පත්කරනු ලැබිණි. ඒ කැඩිස්ටර් ජෝශප්, සන්දුනම්වේලු, අරුලා නන්දන්, සිංහරායන් සහ වෙල්ලයන් නාදන් යන අයවය.

මෙම දෙමළ තරුණයන්ව අත්අඩංගුවට ගත්තේ නිකම්ම නිකම් බෝම්බ ඇටවීමට පැමිණ නොවේ. ඇමැතිවරයෙකු ඝාතනය කිරීමට ක්ලේමෝ බෝම්බ ඇටවීමට පැමිණි බවට චෝදනා කරමිනි. එබැවින් ඔවුන්ගෙන් ප්‍රශ්න කර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හා ඊට අදාළ පරීක්ෂණ කටයුතු මෙහෙයවීමට එම දෙමළ තරුණයන්ව රහස් පොලිසියට හෝ කොළඹ ත්‍රස්තවාදී විශේෂ විමර්ශන ඒකකයට (D.I.D.) භාරදිය යුතු ය. නමුත් මෙහිදී එවැනි දෙයක් සිදුවුණේ නැත. එම තරුණයන්ගෙන් සාමාන්‍ය ප්‍රශ්න කිරීමක් කර ඉන් තිදෙනකු ඇප මත නිදහස් කළ අතර, අනෙක් පස්දෙනාව රිමාන්ඩ් භාරයට පත් කෙරිණි. එයින්ම මෙම තරුණයන් බෝම්බ සිද්ධියට හෝ කොට් සංවිධානයට කිසිදු සම්බන්ධයක් නැති බව පැහැදිලි වනවා ඇත.

යම් හෙයකින් මෙම තරුණයන්ව හා බෝම්බ සිද්ධියේ පරීක්ෂණ රහස් පොලිසියට (C.I.D.) හෝ ත්‍රස්තවාදී විමර්ශණ ඒකකයට භාර දුන්නේ නම්, බෝම්බ සිද්ධියේ සැබෑ තතු හෙළිවනු ඇත. එසේ වූයේ නම්, මෙය කොට් ඇටවූ බෝම්බයක් ද ඇමැති සගයන් ඇටවූ බෝම්බ ජවනිකාවක් ද යන්න මනාව හෙළිදරව් වනු ඇත. එය වැළැක්වීම උදෙසා පරීක්ෂණ කටයුතු මෙලෙස වෙනත් පැත්තකට නතුකර යටපත් කරනු ලැබ තිබේ.

මෙම බෝම්බ සිද්ධියේ සැබෑ තතු ඇමැතිවරයා දන්නවාද නැද්ද යන්න පැහැදිලිව ප්‍රකාශ කිරීමට අපහසු ය. නමුත් නොදන්නවා විය නොහැකි බව රාජ්‍ය බුද්ධි සේවා (S.I.S.) නිලධාරීන්ගේ අදහස වී ඇත. මන්ද බුද්ධි සිද්ධියේ සැබෑ ස්වභාවය නොදන් නේ නම්, එය හෙළිකර ගැනීමට පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාගෙන් විශේෂ ඉල්ලීමක් කර පරීක්ෂණ රහස් පොලිසිය හෝ ත්‍රස්තවාදී විමර්ශන ඒකකයට පැවැරීමට හැකියාව තිබිණි. නමුත් ඔහු එවැනි ඉල්ලීමක් කර නැත.

එමගින් හැඟී යන්නේ ඔහුත් සිද්ධිය දන්නා බව විය හැකි යැයි පරීක්ෂණ අංශවල අදහස වී ඇත. තමන්ව ඝාතනය කිරීමට දැරූ ප්‍රයත්නය පිළිබඳව රඹුක්වැල්ල ඇමැතිවරයා විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස වගකිව යුතු පාර්ශවවලින් නොඉල්ලන්නේ ඇයි? එය සැලකිය යුතු බරපතළ කරුණකි. මෙය මහනුවර පොලිසියට කළ හැකි පරීක්ෂණයක් නොවේ. අනිවාර්යයෙන්ම මෙය රහස් පොලිසියට හෝ ත්‍රස්තවාදී විමර්ශණ ඒකකයට භාර දිය යුතු ය. එහෙත් එවැනි ස්වභාවයක් තවමත් දක්නට නැත. නමුත් රාජ්‍ය බුද්ධි සේවයේ (S.I.S.) පරීක්ෂණ වාර්තා සැලකිල්ලට භාජනය කරමින් රහස් පොලිසිය විශේෂ පරීක්ෂණයක් ආරම්භ කරමින් මෙම බෝම්බ ජවනිකා නාටකය රඟ දැක්වූ අයව අත්අඩංගුවට ගැනීමට බොහෝ දුරට ඉඩ ඇත. මෙම බෝම්බ සිද්ධියේ සැබෑ තතු හා සැක කටයුතු ක්‍රියාකාරකම් පිළිබඳව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ඡෝධාභය රාජපක්ෂ මහතාගේ අවධානයට යොමු කිරීමට බුද්ධි සේවය පියවර ගනිමින් සිටී.